ආයතන චක්‍රලේඛ ලිපි අංකය: 54

අංක 578ර/25. සීඑ
1971 අගෝස්තු මස 2 දින,
කොළඹ 7,
ටොරින්ටන් චතුරශ්‍රයේ,
රාජ්‍ය පරිපාලන, පළාත් පාලන හා
ස්වදේශ කටයුතු අමාත්‍යාංශයේ දීය.

සියලුම ස්ථිර ලේකම්වරුන් හා
දෙපාර්තමේන්තු ප්‍රධානීන් වෙතය.

අධ්‍යයනය හෝ පුහුණුව සඳහා පිටරට යන නිලධාරීහු –
ගිවිසුම් හා බැඳුම්කර.

අංක 627 හා 63.11.25 දින දරන භාණ්ඩාගාර චක්‍රලේඛයේ 1(අ) ඡේදයේ (11) (අ) සටහන බලන්න. ඒ අනුව, අධ්‍යයනය හා පුහුණුව සඳහා පිටරට යවනු ලබන නිලධාරීන්, එම අධ්‍යයනයේ හෝ පුහුණුවේ කාලය මාස 3 ට අඩු නම්, අධ්‍යයනය හෝ පුහුණුව සම්පූර්ණ වූ පසු නිශ්චිත කාලයක් රජයට සේවය කිරීමට ගිවිසුමක් අත්සන් කිරීමේ නියමයෙන් නිදහස් කළ හැකිය.

2. අධ්‍යයනය හෝ පුහුණුව සඳහා තුන් මසකට අඩු එහෙත් එක් මසකට වැඩි කාල පරිච්ඡේදයන්ට පවා පිටරට යවනු ලබන නිලධාරීන් ද තම අධ්‍යයනය හෝ පුහුණුව සම්පූර්ණ වූ පසු පහත දැක්වෙන කාලයන්ට රජයට සේවය කිරීමට ගිවිසුම් අත්සන් කළයුතු යයි පසුව තීරණය කරනු ලැබ තිබේ:-

| අධ්‍යයන/පුහුණු කාලය | අනිවාර්ය සේවා කාලය. | අනිවාර්ය සේවය වෙනුවට අලාභය. |
|---|---|---|
| එක් මසකට වැඩි එහෙත් දෙමසකට අඩු | එක් අවුරුද්දයි. | රු. 5,000/- |
| දෙමස හා ඉන් වැඩි එහෙත් තුන් මසකට අඩු | අවුරුදු දෙකයි. | රු.10,000/- |

(සටහන: ගමනට ගතවූ කාලය ද අධ්‍යයන/පුහුණු කාලයට ඇතුළත් වනු ඇත.)

3. අවශ්‍ය ගිවිසුම්/බැඳුම්කර කෙටුම්පත් ආයතන අධ්‍යක්ෂ විසින් පිළියෙල කළ යුතු අතර ඒවා ඇටෝර්නි ජනරාල්ගේ අනුමතිය ලැබිය යුතුය.

4. තෙමසකට හෝ ඊට වැඩි කාලයකට අධ්‍යයනය හෝ පුහුණුව සඳහා පිටරට යන නිලධාරීන් සම්බන්ධයෙන් අනුගමනය කළ යුතු ක්‍රියාමාර්ගය, එම අධ්‍යයනයේ/පුහුණුවේ වියදම රු.10,000/-ට අඩු නම් අනිවාර්ය සේවය වෙනුවට ගෙවිය යුතු අලාභය රු.10,000/- වියයුතු බව හැරෙන්ට, අංක 627 හා 63.11.25 දින දරන භාණ්ඩාගාර චක්‍රලේඛයේ දැක්වෙන පරිදිම වනු ඇත.

අ.ක/ බී. මහාදේව
රාජ්‍ය පරිපාලන, පළාත් පාලන හා
ස්වදේශ කටයුතු අමාත්‍යාංශයේ ස්ථිර ලේකම්.

රාජ්‍ය පරිපාලන අධ්‍යක්ෂ ජනරාල්
වෙනුවට.

වේ/3-